# මාසික විවරණිකාව

2013 සැප්තැම්බර්



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

**63 වැනි වෙළුම 09 වැනි කලාපය**

**2013 සැප්තැම්බර්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශයඃ ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

# පටුන

*පිටුව*


| | | |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් | ..... | 05 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2013 සැප්තැම්බර් | ..... | 07 |
| 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 සැප්තැම්බර් | ..... | 07 |
| 2. ශ්‍රී ලංකා ආර්ථිකය 2013 වසරේ දී සියයට 7.5 ක වර්ධනයක් අත්පත් කර ගැනීමේ මාවතක | ..... | 09 |
| 3. 2013 ජූලි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය | ..... | 10 |
| 4. ආහාර මිල ගණන් අඩු වීමෙන් 2013 සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය පහළ වැටේ | ..... | 15 |
| 5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2011, 2012 සහ 2013 | ..... | 16 |

# 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2013 සැප්තැම්බර්

### රාජ්‍ය මූල්‍ය අංශය

- ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී., සීමාසහිත හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැංකින් කෝපරේෂන් සමාගම සහ සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කරන ලදී.

### ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ලද ණය

අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ වැඩසටහන මූල්‍යනය කිරීම සඳහා 2013 අගෝස්තු මස 19 වන දින එ.ජ.ඩොලර් මිලියන 100 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 13.2 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 2 ක පොලී අනුපාතිකයක් අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 25 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා අවසන් කළ යුතුය.

### ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ලද ණය

අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ වැඩසටහන මූල්‍යනය කිරීම සඳහා 2013 අගෝස්තු මස 19 වන දින විශේෂ ගැනුම් හිමිකම් මිලියන 66.59 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 13.3 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය මත වාර්ෂිකව සියයට 0.4 ක පොලී අනුපාතිකයක් ද සියයට 0.1 ක කල්පිරීමේ වාරිකයක් සහ වාර්ෂිකව සියයට 0.15 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 26 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් (IDA) ලද ණය

සෞඛ්‍ය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ දෙවන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2013 අගෝස්තු 19 වන දින විශේෂ ගැනුම් හිමිකම් මිලියන 129.80 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 26.0 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 1.25 ක පොලී අනුපාතිකයක් ද වාර්ෂිකව සියයට 0.75 ක සේවා ගාස්තුවක් සහ වාර්ෂිකව සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 25 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා අවසන් කළ යුතුය.

### BNP Paribas Fortis බැංකුවෙන් ලද ණය

වානේ දුම්රිය පාලම් 7 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියට සහය දැක්වීම සඳහා 2013 අගෝස්තු මස 14 වන දින යූරෝ මිලියන 4.44 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 774.8 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ BNP Paribas Fortis බැංකුව අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා පදනම් පොලී අනුපාතිකය (0%) මත වාර්ෂිකව සියයට 1 ක ස්ථාවර ආන්තිකයක් සහිත පොලී අනුපාතිකයක් ද, වාර්ෂිකව සියයට 0.25 ක අනිවාර්යය ගෙවීමක් සහ සියයට 0.5 ක මූලික ගෙවීමක් අදාළ වේ. වසර 2 ක සහන කාලයකට යටත්ව වසර 15.5 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා අවසන් කළ යුතුය.

**හැටන් නැෂනල් බැංකුවෙන් ලද ණය**

රුධිර බැංකු ඉදිකිරීම සහ වැඩි දියුණු කිරීමට සහය දැක්වීම සඳහා 2013 අගෝස්තු 06 වන දින යුරෝ මිලියන 3.19 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 556.1 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ හැටන් නැෂනල් බැංකුව අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය මත (සය මාසික) සියයට 5.7 ක පොලී අනුපාතිකයක් ද වාර්ෂිකව සියයට 0.35 ක කළමනාකරණ ගාස්තුවක් ද අදාළ වේ. වසර 3 ක සහන කාලයකට යටත්ව වසර 11 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනින් (UNDP) ලද ප්‍රතිපාදන**

නීතිය බලාත්මක කිරීම ශක්තිමත් කිරීම, යුක්තිය හා සමාජ සංසටනයට ප්‍රවේශවීමට සහය දැක්වීම සඳහා 2013 අගෝස්තු මස 30 වන දින එ.ජ.ඩොලර් මිලියන 10.97 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.5 ක) ප්‍රතිපාදන මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අතර ගිවිසුමකට අත්සන් තබන ලදී.

**II වන කොටස**

# පුවත්පත් නිවේදන

**2013 සැප්තැම්බර්**

## 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 සැප්තැම්බර්

*ශ්‍රී ලංකා ආර්ථිකය, 2013 පළමු කාර්තුවේදී වාර්තා කළ සියයට 6.0 ක (මූර්තමය වශයෙන්) වර්ධනයට සාපේක්ෂව දෙවන කාර්තුවේදී සියයට 6.8 ක වර්ධනයක් වාර්තා කළේය. කාර්මික අංශයෙහි ඉහළ ක්‍රියාකාරීත්වයක් නොකඩවාම පැවතීම සහ සේවා අංශය යථා තත්ත්වයට පත්වීම දෙවන කාර්තුවේ වර්ධනය සඳහා දායකවූ නමුත් කෘෂිකාර්මික අංශයෙහි මන්දගාමී වර්ධනයක් සිදුවිය.*

2012 වසරේ දක්නට ලැබුණු මන්දගාමී වර්ධනය නැවත යථා තත්ත්වයට පත් වෙමින් දළ දේශීය නිෂ්පාදිතය ක්‍රමයෙන් වර්ධනය වීම, 2013 වසරේදී ආර්ථිකය ඉලක්කගත සියයට 7.5 ක වර්ධනය ලඟාකර ගැනීමට ඇති ශක්‍යතාවය තහවුරු කරයි. දේශීය ආර්ථික කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත්වීමට සමගාමීව ගෝලීය ආර්ථිකයෙහි අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම, දේශීය ආර්ථිකයෙහි වර්ධන ගම්‍යතාවය තවදුරටත් ඉහළ දමනු ඇත.

වෙළෙඳ හිඟය යහපත්වීම, සංචාරක ඉපැයීම්, විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලද ප්‍රේෂණ, ඍජු විදේශ ආයෝජන, බැංකු අංශය වෙත වූ විදේශ ණය ප්‍රාග්ධන සහ රජයේ සුරැකුම්පත් වෙත වූ විදේශ ආයෝජන වැනි විදේශ ප්‍රවාහ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ස්ථායීව පවත්වා ගැනීමට උපකාරී විය. කෙසේවෙතත්, මෑතකදී දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි යම් විචලතාවයක් දක්නට ලැබුණු අතර, මෙය නැගී එන ආර්ථිකයන්ට බලපෑම් ඇති කරමින් ඇමෙරිකා එක්සත් ජනපදයෙහි සිදු කිරීමට නියමිත ගුණාත්මක ලිහිල්කිරීම් අවම කිරීම හේතුකොටගෙන සිදු විය. මේ අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කරයෙන් අපේක්ෂිත ලැබීම් මගින් වෙළෙඳපොළ විශ්වාසනීයත්වය ශක්තිමත් වූ අතර, මෑතකදී රුපියල අවප්‍රමාණය වීම බොහෝදුරට වෙළෙඳපොළ අපේක්ෂාවන් මතම සිදු වූ බව පෙන්නුම් කෙරේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජාත්‍යන්තර බැඳුම්කරයේ ලැබීම්, ඉතුරුම් - ආයෝජන පරතරය මූල්‍යනය කිරීම සඳහා දායක වන අතරම එමගින් තවදුරටත් දළ නිල සංචිතය ඉහළ නැංවීම සිදු වනු ඇති අතර, එය වසර අවසානයේදී අපේක්ෂිත එක්සත් ජනපද ඩොලර් බිලියන 7.0 ක දළ නිල සංචිත ඉලක්කය ලඟා කර ගැනීමට උපකාරී වනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික 2013 මැයි මාසයේ දී පහළ දැමීමත් ඉන් අනතුරුව ජූලි මාසයේදී සිදු කළ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය පහළ දැමීමත් මගින් දේශීය ණය වෙළෙඳපොළ තත්ත්වයන් ලිහිල් වූ අතර එමගින් වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ ගියේය. කෙටිකාලීන ණය පොලී අනුපාතිකයන්ගේ පහළ යාම දීර්ඝකාලීන ණය පොලී අනුපාතික කෙරෙහි ද පැතිරයාම ආරම්භ වී ඇති අතර එම ප්‍රවණතාව ඉදිරි මාසවලදී තවදුරටත් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙමගින් ආර්ථික නියෝජිතයන්ගේ ණය පිරිවැය තවදුරටත් පහත වැටෙනු ඇත. මෙම වර්ධනයන්ගේ ප්‍රතිලාභ ලබමින් වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණයෙහි නාමික අගය 2013 ජූලි මාසයේ දී රුපියල් බිලියන 28.5 කින් ඉහළ ගිය නමුත් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ණය වර්ධනය, පදනම් බලපෑම හේතුකොටගෙන ජූනි මාසයේ දී පැවති සියයට 8.9 සිට ජූලි මාසයේ දී සියයට 8.4 දක්වා පහත වැටුණි. පෞද්ගලික හා රාජ්‍ය අංශයට ලබා දුන් ණය ප්‍රමාණයෙහි ප්‍රසාරණය පිළිඹිබු කරමින්,

2013 වර්ෂය සඳහා ඉලක්කගත සියයට 15 ක් වන සාමාන්‍ය මුදල් ප්‍රසාරණය අභිබවා යමින් 2013 ජූලි මාසයේ දී පුළුල් මුදල්හි ($M_{2b}$) සියයට 16.4 කින් වර්ධනය විය. රජයේ අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධකරණ ප්‍රයත්නයන් සහ රාජ්‍ය සංස්ථාවන්හි ඉහළ මූල්‍ය විනය, වාණිජ බැංකු මත රාජ්‍ය අංශයේ රඳා පැවැත්ම පහළ දමනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණයේ ප්‍රතිලාභ පෞද්ගලික අංශය වෙත ගලායනු ඇත.

උද්ධමනය පිළිබඳව ඉදිරි දැක්ම තවදුරටත් සතුටුදායක මට්ටමක පවතිනු ඇත. ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩයන්හි මිළ ගණන් ඉහළ යාමේ පීඩනයක් නොමැතිවීම, හිතකර කාලගුණික තත්ත්වයන් පැවතීම හමුවේ දේශීය ආහාර සැපයුම වර්ධනය වීම හා ඉල්ලුම් පීඩන අඩු මට්ටමක පැවතීම, වසරේ මේ දක්වා උද්ධමනයට හිතකර ලෙස බලපා ඇත. මේ අනුව කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2006/07=100) මගින් මනිනු ලබන උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ජූලි මාසයේ පැවති සියයට 6.1 සිට අගෝස්තු මාසයේ දී සියයට 6.3 දක්වා සුළු වශයෙන් ඉහළ ගිය අතර මූලික උද්ධමනය පෙර මාසයේ පැවති සියයට 3.1 හි ම නොවෙනස්ව පැවතුණි.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2013 සැප්තැම්බර් මස 16 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසුයැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර ඒ අනුව, මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙලින් සියයට 7.00 සහ සියයට 9.00 ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

ඉදිරියට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත් කරනු ඇත.

## 2. ශ්‍රී ලංකා ආර්ථිකය 2013 වසරේ දී සියයට 7.5 ක වර්ධනයක් අත්පත් කර ගැනීමේ මාවතක

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු අනුව 2013 වසරේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 6.8 කින් වර්ධනය වී ඇත. කර්මාන්ත සහ සේවා යන අංශ දෙකම මෙම වර්ධනය කෙරෙහි සාධනීය ලෙස දායක වී ඇති අතර, කෘෂිකාර්මික අංශයෙහි සංකෝචනයක් දක්නට ලැබේ. මෙහිදී කර්මාන්ත අංශය සිය වර්ධන උපනතිය පවත්වා ගනිමින් සියයට 10.1 ක ප්‍රසාරණයක් වාර්තා කර ඇත.*

මෙම වර්ධනය කෙරෙහි ඉදිකිරීම්, නිෂ්පාදන කර්මාන්ත, පතල් සහ කැණීම් සහ විදුලිය, ගෑස් සහ ජලය යන උප අංශවල වර්ධනය සාධනීය ලෙස බලපා ඇත. එසේම, සේවා අංශය වාර්තා කරන ලද සියයට 6.6 ක ප්‍රසාරණය සඳහා ප්‍රධාන ලෙස තොග සහ සිල්ලර වෙළෙඳාම, ප්‍රවාහනය සහ සන්නිවේදනය යන උප අංශයන්ගේ වර්ධනය හේතු වී ඇත. තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශයෙහි වර්ධනය කෙරෙහි විදේශ මෙන්ම දේශීය වෙළෙඳ කටයුතුවල ප්‍රසාරණය ද හේතු විය. එනමුත් කෘෂිකාර්මික අංශය සියයට 1.1 කින් සංකෝචනය වී ඇති අතර, අහිතකර කාලගුණය හේතුවෙන් පොල් සහ රබර් නිෂ්පාදනය පහත වැටීමත් වී සහ අනෙකුත් ආහාර බෝග ඇතුළු දේශීය කෘෂිකාර්මික බෝග නිෂ්පාදනයන්ගේ වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතීම ද බලපා ඇත. ඒ අනුව, දෙවන කාර්තුවේ අත්පත් කරගත් මෙම ආර්ථික වර්ධනයත් සමගම මෙරට ආර්ථිකය 2013 වසරේ පළමු භාගයේ දී සියයට 6.3 ක වර්ධනයක් අත්කර ගෙන ඇත.

2013 වසරේ දෙවන භාගයේ දී ගෝලීය ආර්ථිකය අපේක්ෂිත ලෙස යථා තත්ත්වයට පත්වීමත් සමගම ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ වර්ධනයක් අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම අපනයන කෙරෙහි යහපත් ඉල්ලුමක් උත්පාදනය වීමට හේතු වනු ඇති අතර, සංචාරක කර්මාන්තයෙහි වර්ධනයට ද දායක වනු ඇත. එසේම විදේශීය මෙන්ම දේශීය ඉල්ලුමෙහි වැඩිදියුණුවීමත් සමගම ක්‍රය ශක්තියෙහි අපේක්ෂිත වර්ධනය නිෂ්පාදන කර්මාන්ත උප අංශය කෙරෙහි සාධනීය ලෙස බලපානු ඇත. ඒ අනුව, නිෂ්පාදන කර්මාන්ත උප අංශයෙහි ප්‍රසාරණයත් සමගම වෙළෙඳාම්, ප්‍රවාහන සහ මූල්‍ය සේවාවන්හි ද වර්ධනයක් අපේක්ෂා කළ හැක. එසේම, 2012 වසරෙහි අග භාගයේ සිට හඳුන්වා දෙන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති තුළින් බැංකු, දේපළ වෙළෙඳාම් සහ රක්ෂණ ක්‍රියාකාරකම් උප අංශයේ ඉහළ වර්ධන ප්‍රවණතාවක් අපේක්ෂා කළ හැක. තවද, රටෙහි ක්‍රියාත්මක වෙමින් පවතින යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් ඉදිකිරීම් උප අංශයේ දැනට පවතින වර්ධන වේගය වසරෙහි දෙවන භාගයේ ද අපේක්ෂා කළ හැක. එමෙන්ම, නියඟයෙහි බලපෑමට ලක් වූ පසුගිය වසරේ යල කන්නයේ කෘෂි නිෂ්පාදන යථා තත්ත්වයට පත්වීම මෙම වසරේ වර්ධන වේගය ඉහළ නැංවීමට හේතු වනු ඇත. තවද, වාණිජ බැංකු පෞද්ගලික අංශයට ලබාදෙනු ලබන ණය ප්‍රමාණයෙහි අපේක්ෂිත වර්ධනය ද ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයට උත්තේජනයක් ලබාදෙනු ඇත. මෙයට අමතරව මෑත කාලීනව දක්නට ලැබුණු පරිදි පෞද්ගලික අංශය බැංකු නොවන ආයතන ණය, ණයකර නිකුතු සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි අරමුදල් වැනි විකල්ප මූල්‍ය ප්‍රභවයන් කෙරෙහි ප්‍රවේශ වීම ඉහත වර්ධන වේගය තවදුරටත් ශක්තිමත් කරනු ඇත. විදේශීය අංශයේ සහ දේශීය ආර්ථිකයේ සාධනීය බලපෑම් හේතුවෙන් 2013 වසර සඳහා අපේක්ෂිත සියයට 7.5ක වර්ධනය බොහෝදුරට අත්කර ගැනීමට හැකිවනු ඇති අතර, ඒ අනුව ආර්ථිකය මධ්‍ය කාලීන වශයෙන් ශක්තිමත් වර්ධන මාවතකට ප්‍රවිශ්ඨ වනු ඇත.

## 3. 2013 ජූලි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණය**

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, අපනයන ඉපැයීම් සහ සංචාරක ඉපැයීම් මෙන්ම මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් යන මූලාශ්‍රයන්ගෙන් අඛණ්ඩව රට තුළට ගලා ආ විදේශ විනිමය ප්‍රවාහයන් හේතුවෙන් 2013 වසරේ පළමු මාස හත තුළදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ස්ථාවරව පැවතුණි. වාණිජ බැංකු සහ පෞද්ගලික අංශය වෙත අඛණ්ඩව විනිමය ප්‍රවාහයන් ලැබීම සහ සංචාරක ඉපැයීම් හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල පුරෝකථනය කර ඇති ලැබීම් හේතුවෙන් 2013 වසරේ ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2013 වසරේ ජූලි මාසයේ දී අඛණ්ඩව දෙවන මසටත් අපනයනයන්හි වර්ධනයක් වාර්තා කිරීමත් සමග වෙළෙඳ ශේෂයේ හිඟය තවදුරටත් අඩු විය.


**ගෙවුම් තුලනයේ වෙළෙඳ ගිණුම**

ඉහළ වෙළෙඳ පරිමාවන් හේතුවෙන් 2013 ජූලි මාසයේ දී අපනයන ආදායම සහ ආනයන වියදම යන දෙකෙහි ම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ වර්ධනයක් අඛණ්ඩව දෙවන මසටත් වාර්තා කරන ලදී. අපනයන ආදායම 2012 ජූලි මාසය හා සැසඳීමේ දී 2013 ජූලි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 858 ක් දක්වා සියයට 8.0 කින් වර්ධනය වූ අතර, ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,601 ක් දක්වා සියයට 20.8 කින් වර්ධනය විය. 2013 ජූලි මාසයේ දී ආනයන වර්ධනයේ සීඝ්‍ර ඉහළ යාම සඳහා පසුගිය වසරේ අදාළ මාසය තුළ ආනයන අඩු මට්ටමක පැවතීම තරමක් දුරට හේතු විය. කෙසේ වුවද, සමුච්චිත අගයන් සැලකූ විට 2012 වසරේ අනුරූප කාලය හා සැසඳීමේ දී 2013 වසරේ පළමු මාස හත තුළ දී අපනයන ආදායම සියයට 2.7 කින් ද, ආනයන වියදම සියයට 2.6 කින් ද අඩු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2013 පළමු මාස හත තුළ දී සමුච්චිත වෙළෙඳ හිඟය 2012 අනුරූප කාලයේ පැවැති එ.ජ. ඩොලර් මිලියන 5,435 සිට එ.ජ. ඩොලර් මිලියන 5,300 ක් දක්වා සියයට 2.5 කින් අඩු විය.

2013 ජූලි මාසයේ දී මුළු අපනයන මෙම වසර තුළ වාර්තා වූ ඉහළම අගය වන එ.ජ. ඩොලර් මිලියන 858 ක් දක්වා ලඟා වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ කෘෂිකාර්මික අපනයනවලින් ද අනතුරුව කාර්මික අපනයනවලින් ද ඉහළ ඉපැයීම් ලැබීමයි. තේ සහ කුළුබඩු අපනයනයන්හි ඉහළ ඉපැයීම් හේතුවෙන් මුළු අපනයනවලට හතරෙන් එකකටත් වැඩි දායකත්වයක් සපයන කෘෂිකාර්මික අපනයන, පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2013 ජූලි මාසයේ දී සියයට 21.6 කින් වර්ධනය විය. 2013 ජූලි මාසයේ දී තේ අපනයනයන්හි පරිමාව සහ සාමාන්‍ය අපනයන මිල පිළිවෙලින් සියයට 12.6 කින් සහ සියයට 6.7 කින් වැඩි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තේ අපනයන ආදායම සියයට 20.2 කින් වර්ධනය විය. කුරුඳු, ගම්මිරිස් සහ කරාබු නැටි වැනි වෙළෙඳ අපනයන පරිමාවන් යහපත් වූ බැවින් කුළු බඩු අපනයන ආදායම සියයට 50.6 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. පොල් මද නිෂ්පාදිත සහ සුළු කෘෂිකාර්මික අපනයන පරිමාව ඉහළ ගිය අතර එමගින් එම නිෂ්පාදිත ආශ්‍රිත අපනයන ආදායමෙහි වැඩිවීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, අපනයන පරිමාවෙහි සහ මිල ගණන් යන දෙකෙහි ම අඩුවීම පෙන්නුම් කරමින්, 2013 ජූලි මාසයේ දී රබර් සහ මුහුදු ආහාර අපනයනයෙන් ලද ආදායම අඩු විය. මේ අතර, 2013 ජූලි මාසයේ දී කාර්මික අපනයන සියයට 3.7 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායමෙහි වර්ධනය හේතු විය. මුළු අපනයනවලින් සියයට 40 කටත් වඩා වැඩි දායකත්වයක් සපයන රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 13.5 කින් වර්ධනය වූ අතර, එම වර්ධනය මුළු අපනයන වර්ධනයට සියයට 70 කින් පමණ දායක විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයෙහි රටවල් වෙත වූ රෙදිපිළි හා ඇඟළුම් අපනයන පිළිවෙලින් සියයට 26.9 කින් සහ සියයට 1.6 කින් වර්ධනය වූ අතර, එම කලාපයන්හි ආර්ථික කටයුතු නැවත යථා තත්ත්වයට පත්වීම මෙයින් පිළිබිඹු විය. කාර්මික අපනයන ආදායමෙහි වර්ධනයට යන්ත්‍රසූත්‍ර හා

යාන්ත්‍රික උපකරණ අපනයන, රසායනික නිෂ්පාදිත සහ සම් භාණ්ඩ අපනයනයන්හි වර්ධනයට සැලකිය යුතු ලෙස දායක විය. මේ අතර, 2013 ජූලි මාසයේ දී මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ සත්ව ආහාර යන කාණ්ඩයන් මගින් ලැබූ අපනයන ඉපැයීම්හි අඩුවීමක් දක්නට ලැබුණි.

2013 ජූලි මාසයේ දී සියළුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්හි වර්ධනයන් වාර්තා කරමින්, ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,601 ක් දක්වා සියයට 20.8 කින් වර්ධනය විය. ආහාරමය සහ ආහාරමය නොවන යන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයන් දෙකෙහිම වර්ධනයක් වාර්තා කරමින්, 2013 ජූලි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 30 කින් වර්ධනය විය. 2012 අප්‍රේල් මාසයේ සිට අඩු වෙමින් පැවැති රථවාහන ආනයන වියදම 2013 ජූනි මාසයේ සිට නැවත වර්ධනය වූ අතර, 2013 ජූලි මාසයේ දී එම වර්ධනය තවදුරටත් වේගවත් වෙමින් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමේ වැඩිවීමට ප්‍රධාන ලෙස දායක විය. මෑතකාලීනව එ.ජ. ඩොලරයට එරෙහිව ඉන්දියානු රුපියල සහ ජපාන යෙන් ඇතුළුව විදේශ ව්‍යවහාර මුදල් වර්ග කිහිපයක් සීඝ්‍රයෙන් අවප්‍රමාණය වීම රථවාහන ආනයනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉන්දියාවෙන් විශාල වශයෙන් ආනයනය කරනු ලබන පරිප්පු, ළූණු සහ කෑමට ගන්නා තෙල් වර්ග වැනි අනෙකුත් ආහාර කාණ්ඩ ද 2013 ජූලි මාසයේ දී සැලකියයුතු ලෙස වර්ධනය විය. 2013 ජූලි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 943.4 ක් දක්වා සියයට 21.5 කින් වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ ඉහළ ආනයන වියදම හේතු විය. මේ අනුව, 2013 ජූලි මාසයේ දී පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන පරිමාව, 2012 ජූලි මාසයට සාපේක්ෂව දෙගුණයකටත් වඩා වැඩි විය. එසේ වුවද, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2013 පළමු මාස හත තුළ දී ඉන්ධන ආනයන වියදමේ අඩුවීමක් වාර්තා කරන ලදී. ඒ අතර, 2013 ජූලි මාසයේ දී ඉන්ධන හැර අනෙකුත් ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,166 ක් දක්වා සියයට 4.3 ක මධ්‍යස්ථ අගයකින් වර්ධනය විය. 2013 ජූලි මාසයේ දී පොහොර සහ ප්ලාස්ටික් භාණ්ඩ සඳහා ආනයන වියදම ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අතරම, අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති රෙදිපිළි හා රෙදිපිළි උපාංග, දියමන්ති හා වටිනා ගල් වර්ග සහ තිරිඟු හා ඉරිඟු යනාදියෙහි ආනයන වියදම් 2013 ජූලි මාසයේ දී අඩු විය. ප්‍රවාහන උපකරණ ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු වුවද, ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන්, ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2013 ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 347.8 ක් දක්වා සියයට 12.8 කින් වර්ධනය විය.



**ගෙවුම් තුලනයේ සේවා ගිණුම යටතේ වන සංචාරක ඉපැයීම්**

2013 අගෝස්තු මාසයේ දී සංචාරක පැමිණීම්, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී 100,224 දක්වා සියයට 26.1 කින් වර්ධනය විය. ඒ අනුව වසරේ පළමු මාස අට තුළදී මුළු සංචාරක පැමිණීම්, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී 711,446 දක්වා සියයට 14.3 කින් වර්ධනය විය. 2013 අගෝස්තු මාසයේ දී සංචාරක ඉපැයීම්, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 110 දක්වා සියයට 34.7 කින් වර්ධනය විය. 2012 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 642 සමග සැසඳීමේදී, 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී මුළු සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 784 ක් දක්වා සියයට 22.1 කින් වර්ධනය විය.

**ගෙවුම් තුලනයේ ජංගම සංක්‍රාම**

2012 ජූලි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 475.0 සමග සැසඳීමේ දී 2013 ජූලි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 555.9 ක් දක්වා සියයට 17.0 කින් වර්ධනය විය. ඒ අනුව, 2012 වසරේ පළමු මාස හත සමග සැසඳීමේ දී 2013 වසරේ පළමු මාස හත තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 3,763.5 ක් දක්වා සියයට 10.1 කින් වර්ධනය විය.

**ගෙවුම් තුලනයේ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම**

ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම වෙත අඛණ්ඩව ගලා ආ විදේශීය ආයෝජන මධ්‍යස්ථ මට්ටමකින් වර්ධනය විය. 2012 වසරේ ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 18.6 ක් වූ කොළඹ කොටස් වෙළෙඳපොලෙහි විදේශ ආයෝජකයන්ගේ ශුද්ධ විදේශ ලැබීම්, 2013 ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 8.6 ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2013 වසරේ පළමු මාස හත තුළදී කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මුළු ශුද්ධ විදේශ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 128.8 ක් විය. 2013 සැප්තැම්බර් මස 23 දින වනවිට කොළඹ කොටස් වෙළෙඳපොලෙහි සමුච්චිත ශුද්ධ විදේශ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 150 ක් විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත 2013 වසරේ ජූලි මාසයේ දී ශුද්ධ විදේශ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 45.9 ක් වුවද, 2012 ජූනි මාසයේ දී එය එ.ජ. ඩොලර් මිලියන 27.4 ක ශුද්ධ ගෙවීමක් ලෙස වාර්තා විය. 2013 සැප්තැම්බර් මස 20 වන දින වනවිට රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොල වෙත වූ සමුච්චිත ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 493 ක් වූ අතර, නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජකයන් සතු භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 3.6 වූ අතර, එමගින් විදේශීය ආයෝජකයන් සඳහා වෙන් කළ සීමාව මද වශයෙන් ඉක්මවීය. මේ අතර, 2012 වසරේ පළමු මාස හත තුළ දී ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවෙන් ලබාගත් එ.ජ. ඩොලර් බිලියන 1 ක මුදල ද ඇතුළුව රජය ලබාගත් දිගුකාලීන ණය ප්‍රමාණය වූ එ.ජ. ඩොලර් මිලියන 2,193.4 සමග සැසඳීමේ දී, 2013 පළමු මාස හත තුළ දී රජය ලබාගත් දිගුකාලීන ණය එ.ජ. ඩොලර් මිලියන 1,054.5 ක් ලෙස අඩු අගයක් වාර්තා කළේය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් ලබාගත් විදේශ ණය ද ඇතුළත් විදේශීය සෘජු ආයෝජන 2012 වසරේ පළමු භාගය තුළදී ලද එ.ජ. ඩොලර් මිලියන 451 සමග සැසඳීමේ දී, 2013 වසරේ පළමු භාගය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 540 ක් දක්වා සියයට 20 කින් වර්ධනය විය. තවද 2013 පළමු භාගය තුළ දී වාණිජ බැංකු වෙත ලැබුණු මුළු විදේශීය ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 664 ක් විය.

**ජාත්‍යන්තර සංචිත**

2013 වසරේ ජූලි මාසය අග වනවිට, ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6.3 ක් වූ අතර, වාණිජ බැංකුවල විදේශීය වත්කම් ද ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම සඳහා වූ ණය ආපසු ගෙවීම්, විදේශ ණය සේවාකරණ ගෙවීම් සහ වටිනාකම තක්සේරු

කිරීමේ දී ඇතිවන වෙනස්වීම් හමුවේ වුවද 2013 පළමු මාස හත තුළ දී ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත සතුටුදායක මට්ටමක පැවතුණු අතර, විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත ප්‍රමාණය පිළිවෙලින් ආනයනික මාස 4.0 කට සහ 4.7 කට සමාන විය.

මේ අතර, 2013 සැප්තැම්බර් මස ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් විදේශ ප්‍රාග්ධන වෙළෙඳපොලට නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කරය සඳහා ලද ඉහළ සහභාගිත්වයත් සමග එ.ජ. ඩොලර් මිලියන 750 ක් ලබාගත් අතර, එමගින් ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ ආයෝජකයන්ගේ අඛණ්ඩ විශ්වාසය පිළිබිඹු විය. එ.ජ. ඩොලර් මිලියන 750 ක මුදලක් ලැබීමත් සමග ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම තවදුරටත් ශක්තිමත් වූ අතර, 2013 සැප්තැම්බර් මස 23 වන දිනට පැවති දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.0 ඉක්මවීය.

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන මුදල් වර්ග කිහිපයකට එරෙහිව වසර තුළ දී මේ දක්වා ශක්තිමත් විය. ඒ අනුව 2013 සැප්තැම්බර් මස 23 දින වනවිට රුපියල, ජපන් යෙන්වලට එරෙහිව සියයට 11.1 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 8.7 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 5.8 කින් ද අධිප්‍රමාණය විය. කෙසේ වෙතත්, 2013 සැප්තැම්බර් මස 23 දින වනවිට රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 3.8 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 3.2 කින් ද, යුරෝවලට එරෙහිව සියයට 6.1 කින් ද, චීන යුආන්වලට එරෙහිව සියයට 5.5 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - ජූලි 2013 (අ)

| | 2012 ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2013 ජූලි (එ.ජ.ඩො. මිලියන) | ජූලි වර්ධනය (සියයට) | 2012 ජන: සිට ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2013 ජන: සිට ජූලි (එ.ජ.ඩො. මිලියන) | ජන: සිට ජූලි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **794.4** | **857.8** | **8.0** | **5,674.2** | **5,518.8** | **-2.7** |
| මෙයින්: | | | | | | |
| කෘෂිකාර්මික | 192.3 | 233.9 | 21.6 | 1,335.6 | 1,351.2 | 1.2 |
| මෙයින්: තේ | 112.8 | 135.6 | 20.2 | 794.8 | 819.7 | 3.1 |
| කාර්මික | 598.5 | 620.5 | 3.7 | 4,300.8 | 4,147.0 | -3.6 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 328.2 | 372.5 | 13.5 | 2,310.4 | 2,373.3 | 2.7 |
| රබර් නිෂ්පාදිත | 69.1 | 67.9 | -1.7 | 502.6 | 465.0 | -7.5 |
| ආහාර පාන හා දුම්කොළ | 21.6 | 17.8 | -17.6 | 160.8 | 121.4 | -24.5 |
| ඛනිජ ද්‍රව්‍ය | 2.8 | 2.2 | -18.6 | 31.7 | 13.7 | -56.8 |
| **ආනයන** | **1,325.0** | **1,601.1** | **20.8** | **11,108.7** | **10,818.6** | **-2.6** |
| මෙයින්: | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 237.4 | 308.7 | 30.0 | 1,860.9 | 1,833.3 | -1.5 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 111.6 | 135.7 | 21.5 | 805.2 | 840.3 | 4.4 |
| ආහාරමය නොවන-පාරිභෝගික භාණ්ඩ | 125.8 | 173.1 | 37.6 | 1,055.7 | 993.0 | -5.9 |
| අන්තර් භාණ්ඩ | 776.7 | 943.4 | 21.5 | 6,648.7 | 6,466.4 | -2.7 |
| මෙයින්: ඛනිජ තෙල් | 207.1 | 434.8 | 110.0 | 2,898.7 | 2,781.3 | -4.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 195.6 | 194.2 | -0.7 | 1,297.2 | 1,160.1 | -10.6 |
| ආයෝජන භාණ්ඩ | 308.4 | 347.8 | 12.8 | 2,580.7 | 2,511.2 | -2.7 |
| මෙයින්: යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 147.4 | 191.1 | 29.7 | 1,199.4 | 1,326.1 | 10.6 |
| ප්‍රවාහන උපකරණ | 68.9 | 57.6 | -16.3 | 681.4 | 384.7 | -43.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 91.8 | 98.7 | 7.5 | 697.5 | 796.9 | 14.3 |
| **වෙළෙඳ ශේෂය** | **-530.6** | **-743.3** | **40.1** | **-5,434.5** | **-5,299.8** | **-2.5** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **475.0** | **555.9** | **17.0** | **3,417.4** | **3,763.5** | **10.1** |
| **විදේශීය සෘජු ආයෝජන** | | | | **451** | **540** | **19.7** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **18.6** | **8.6** | | **205.1** | **128.8** | |
| **සංචාරක ඉපැයීම්** | **100.5** | **108.8** | **8.3** | **560.4** | **674.1** | **20.3** |
| **වාණිජ බැංකු වෙත ලැබීම් (ආ)** | | | | | **664.3** | |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ)** | **1,683.9** | **314.7** | **-81.3** | **3,983.1** | **3,097.1** | **-22.2** |
| එයින්: භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 573.6 | 205.3 | -64.2 | 1,725.0 | 2,023.8 | 17.3 |
| දිගුකාලීන ණය | 1,106.7 | 109.3 | -90.1 | 2,193.4 | 1,054.5 | -51.9 |

(අ) තාවකාලික

(ආ) 2012 වසර තුළ දී වාණිජ බැංකු විසින් ලබාගත් දිගුකාලීන විදේශ ණය එ.ජ.ඩොලර් මිලියන 973 ක් විය.


(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

## 4. ආහාර මිල ගණන් අඩු වීමෙන් 2013 සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය පහළ වැටේ.

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත, පූර්ව මාසයේ වාර්තා කළ  සියයට 6.3 හි සිට 2013 සැප්තැම්බර් මාසයේ දී සියයට 6.2 දක්වා පහළ වැටිණි.  මෙයට, ප්‍රධාන වශයෙන්ම, ආහාර මිල ගණන් පහළ මට්ටමක පැවතීම හේතු විය.  වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය ද අගෝස්තු මාසයේ වාර්තා කළ සියයට 8.0 හි සිට සැප්තැම්බර් මාසයේ දී තවදුරටත් සියයට 7.8 දක්වා අනුයාත සිව්වන මාසයටත් පහළ ගියේය.*

මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයෙහි ම පදනම මත අගෝස්තු මාසයේ පැවති සියයට 3.1 හි සහ සියයට 5.9 හි සිට 2013 සැප්තැම්බර් මාසයේ දී පිළිවෙළින් සියයට 3.0 සහ සියයට 5.7 දක්වා පහළ වැටිණි.

කො.පා.මි. දර්ශක අගය 2013 අගෝස්තු මාසයේ පැවති 176.2 හි සිට 2013 සැප්තැම්බර් මාසයේ දී 175.8 දක්වා නිරපේක්ෂ වශයෙන් අඩු වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.2 කින් පහළ ගියේය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ගණන් සියයට 0.5 කින් පහළ යාම දර්ශකයේ මෙම මාසික අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය.  ආහාර කාණ්ඩය තුළ බොහොමයක් සහල් වර්ග, එළවළු, නැවුම් මත්ස්‍ය වර්ග, කරවල, කුකුළු මස්, අර්තාපල්, අමු මිරිස් සහ ලොකු ළූණු ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ පහළ ගියේය.  කෙසේ වුව ද, සමහර පළතුරු වර්ග, පොල්, ළදරු කිරිපිටි, බිත්තර, රතු ළූණු සහ දෙහි යන ආහාරවල මිල ගණන්හි ඉහළ යාමක් වාර්තා විය.  ආහාර නොවන කාණ්ඩයේ, රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයෙහි මිල ගණන් සියයට 0.3 කින් පහළ වැටිණි. කෙසේ වුවද, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.1); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.1); සෞඛ්‍ය (සියයට 0.2); ප්‍රවාහන (සියයට 0.1); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 1.0); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.1) යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. මේ අතර, සන්නිවේදන සහ අධ්‍යාපන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.



## 5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2011, 2012 සහ 2013

(2006/07= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 |
| ජනවාරි | 149.2 | 154.8 | 170.0 | 1.4 | 0.3 | 0.8 | 6.2 | 3.8 | 9.8 | 6.1 | 6.5 | 8.1 |
| පෙබරවාරි | 151.3 | 155.4 | 170.7 | 1.4 | 0.4 | 0.4 | 7.2 | 2.7 | 9.8 | 6.1 | 6.1 | 8.6 |
| මාර්තු | 150.6 | 158.8 | 170.8 | -0.5 | 2.2 | 0.1 | 7.7 | 5.5 | 7.5 | 6.2 | 5.9 | 8.8 |
| අප්‍රේල් | 150.6 | 159.8 | 170.0 | 0.1 | 0.6 | -0.5 | 8.9 | 6.1 | 6.4 | 6.4 | 5.7 | 8.8 |
| මැයි | 151.5 | 162.1 | 173.9 | 0.6 | 1.4 | 2.3 | 8.2 | 7.0 | 7.3 | 6.6 | 5.6 | 8.8 |
| ජූනි | 151.2 | 165.2 | 176.5 | -0.2 | 1.9 | 1.5 | 7.1 | 9.3 | 6.8 | 6.7 | 5.8 | 8.6 |
| ජූලි | 151.7 | 166.7 | 176.8 | 0. 4 | 0.9 | 0.2 | 7.5 | 9.8 | 6.1 | 7.0 | 6.0 | 8.3 |
| අගෝස්තු | 151.3 | 165.7 | 176.2 | -0.3 | -0.6 | -0.3 | 7.0 | 9.5 | 6.3 | 7.1 | 6.3 | 8.0 |
| සැප්තැම්බර් | 151.7 | 165.5 | 175.8 | 0.3 | -0.1 | -0.2 | 6.4 | 9.1 | 6.2 | 7.2 | 6.5 | 7.8 |
| ඔක්තෝබර් | 151.5 | 165.0 | | -0.1 | -0.3 | | 5.1 | 8.9 | | 7.1 | 6.8 | |
| නොවැම්බර් | 152.6 | 167.1 | | 0.7 | 1.3 | | 4.7 | 9.5 | | 6.9 | 7.2 | |
| දෙසැම්බර් | 154.4 | 168.6 | | 1.2 | 0.9 | | 4.9 | 9.2 | | 6.7 | 7.6 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව